# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
# මහාමාර්ග අමාත්‍යංශය
# මාර්ග සංවර්ධන අධිකාරිය
# පුරප්පාඩු

## කාර්මික නිළධාරී, ප්‍රමාණ සමීක්ෂක, සහකාර ප්‍රමාණ සමීක්ෂක, ප්‍රමාණ සමීක්ෂක සහකාර, පර්යේෂණ සහකාර සහ සැලසුම් ශිල්පී තනතුරු

මාර්ග සංවර්ධන අධිකාරියේ ඉහත දැක්වෙන තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඉහත දැක්වෙන තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් පහත පරිදි වේ.

**01. කාර්මික නිළධාරී (සිවිල්)**

**වැටුප් පරිමාණය** : MA 2-2(B) – රු.33,660 - 350x6- 600x14 – 44,160/-

**අවශ්‍ය වන අවම සුදුසුකම් හා පළපුරුද්ද**

මොරටුව විශ්වවිද්‍යාලයෙන් ජාතික තාක්ෂණ (සිවිල් ) ඩිප්ලෝමාව (NDT – Civil) ලබා තිබීම

**හෝ**

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරියේ (NAITA) වසර හතරක විශේෂ ආධුනිකත්ව /සිවිල් ඉංජිනේරු විද්‍යා පිළිබඳ ජාතික ඩිප්ලෝමාව (NDES) ලබා තිබීම

**හෝ**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය වෙතින් තාක්ෂණ (සිවිල්) ඩිප්ලෝමාව ලබා තිබීම

**හෝ**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ (SLIATE) ඉංජිනේරු උසස් ජාතික පාඨමාලාව (සිවිල්) **හෝ** තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් අනුමත කළ ජාතික වෘත්තීය සුදුසුකම (NVQ Level – 6) මට්ටමට සමාන සුදුසුකමක් ලබා තිබීම

**02. ප්‍රමාණ සමීක්ෂක**

**වැටුප් පරිමාණය** : MM 1-1 – රු. 53,175 –10x1,375-15x1,910-95,575/-

**අවශ්‍ය වන අවම සුදුසුකම් හා පළපුරුද්ද**

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනයෙහි (IQSSL හි) උපාධි සාමාජිකත්වය තිබීම

**හෝ**

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) වෙතින් ප්‍රතීතනය කල, ප්‍රමාණ සමීක්ෂක ක්ෂේත්‍රයේ උපාධියක් දරණ උපාධිධරයෙක් වීම.

**හෝ**

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) සමග වලංගු අන්‍යෝන්‍ය ගිවිසුමක් සහිත විදේශ ප්‍රමාණ සමීක්ෂක වෘත්තීය ආයතනයක ඡන්ද අයිතිය සහිත පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

**සහ**

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) විසින් පිළිගනු ලබන ආයතනයක ප්‍රසාද ලකුණු (credits) 120 කට නොඅඩු ප්‍රමාණ සමීක්ෂණ ක්ෂේත්‍රයේ උපාධියක් තිබීම.

**03. සහකාර ප්‍රමාණ සමීක්ෂක**

**වැටුප් පරිමාණය** : MA 2-2 (B) – රු.33,660 - 350x6- 600x14 – 44,160/-

**අවශ්‍ය වන අවම සුදුසුකම් හා පළපුරුද්ද**

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනයෙහි (IQSSL හි) තාක්ෂණික සාමාජිකත්වය තිබීම

**හෝ**

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) මගින් පිළිගනු ලබන ආයතනයක ප්‍රසාද ලකුණු (credits) 90 කට නොඅඩු ප්‍රමාණ සමීක්ෂක ක්ෂේත්‍රයේ උපාධියක් තිබීම,

**හෝ**

1990 අංක 20 දරන තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ස්ථාපිත තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික වෘත්තීය සුදුසුකමේ VII වන මට්ටමේ ප්‍රමාණ සමීක්ෂක සුදුසුකම් තිබීම.

**හෝ**

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) විසින් පිළිගත් ආයතනයක ප්‍රසාද ලකුණු (credits) 60 කට නොඅඩු ප්‍රමාණ සමීක්ෂක උසස් ඩිප්ලෝමාව සහිතව විදේශ ප්‍රමාණ සමීක්ෂක වෘත්තීය ආයතනයක ඡන්ද අයිතිය සහිත පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

**හෝ**

1990 අංක 20 දරන තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ස්ථාපිත තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික වෘත්තීය සුදුසුකමේ VI වන මට්ටම සහිතව ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) විසින් පිළිගත් විදේශ ප්‍රමාණ සමීක්ෂක වෘත්තීය ආයතනයක ඡන්ද හිමිකම සහිත පූර්ණ සාමාජිකයෙකු වීම.

**04. ප්‍රමාණ සමීක්ෂක සහකාර**

**වැටුප් පරිමාණය** : MA 2-2 (A) – රු.30,310 - 300x18 - 35,710/-

**අවශ්‍ය වන අවම සුදුසුකම් හා පළපුරුද්ද**

1990 අංක 20 දරන තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ස්ථාපිත තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික වෘත්තීය සුදුසුකමේ IV වන මට්ටමේ ප්‍රමාණ සමීක්ෂක සුදුසුකම සහිතව ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනයෙහි (IQSSL හි) ලියාපදිංචි සාමාජිකත්වය තිබීම.

**හෝ**

ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) විසින් පිළිගත් ආයතනයක ප්‍රසාද ලකුණු (credits) 30 කට නොඅඩු ප්‍රමාණ සමීක්ෂක ඩිප්ලෝමාවක් තිබීම.

**හෝ**

1990 අංක 20 දරන තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ස්ථාපිත තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික වෘත්තීය සුදුසුකමේ V වන මට්ටමට නොඅඩු ප්‍රමාණ සමීක්ෂණ සුදුසුකමක් තිබීම.

**හෝ**

1990 අංක 20 දරන තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන පනත යටතේ ස්ථාපිත තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ජාතික වෘත්තීය සුදුසුකමේ IV වන මට්ටමේ ප්‍රමාණ සමීක්ෂණ සුදුසුකම සහිතව ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂක ආයතනය (IQSSL) විසින් පිළිගත් ආයතනයක ප්‍රසාද ලකුණු (credits) 30 කට නොඅඩු ප්‍රමාණ සමීක්ෂණ පශ්චාත් උපාධිය ලබා තිබීම.

**05. පර්යේෂණ සහකාර**

**වැටුප් පරිමාණය** : MA(1-2) – Rs.27,910 – 300x14 – 32,110/-

**අවශ්‍ය වන අවම සුදුසුකම් හා පළපුරුද්ද**

මව්බස සහ ගණිතය ඇතුළු විෂයයන් හතරක් සඳහා සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් විෂයන් 06 ක් සමත්ව තිබීම

**සහ**

රසායන විද්‍යාව සහ සංයුක්ත ගණිතය/ භෞතික විද්‍යාව විෂයන්ට සම්මාන සාමාර්ථ 2ක් සහිතව අ.පො.ස.(උ/පෙළ) විභාගය සමත්ව තිබීම.

**සහ**

පිළිගත් ආයතනයක අවුරුදු 03 ක පලපුරුද්දක් ලබා තිබීම

**06. සැලසුම් ශිල්පී**

**වැටුප් පරිමාණය** : MA 2-2(A) – Rs.30,310 – 300x18 – 35,710/-

**අවශ්‍ය වන අවම සුදුසුකම් හා පළපුරුද්ද**

මව්බස සහ ගණිතය ඇතුළු විෂයයන් හතරකට සම්මාන සාමාර්ථය සහිතව එක් වරකදී අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් විෂයන් 06 ක් සමත්ව තිබීම සහ එක් වරකදී අ.පො.ස.(උ/පෙළ) විභාගයෙන් විෂයන් 3ක් සමත්ව තිබීම.

**සමග**

රජයේ කාර්මික විද්‍යාලයකින් අධුනිකත්ව සැලසුම් ශිල්පී සහතිකය/ ජාතික ඉංජිනේරු සැලසුම් ශිල්පී සහතිකය ලබා තිබීම

**සමග**

පිලිගත් ආයතනයක අදාල ක්ෂේත්‍රයේ ඔටෝකැඩ් සැලසුම්කරණය සම්බන්ධ වසර 03 ක පලපුරුද්දක් ලබා තිබීම

**වයස් සීමාව** - අපේක්ෂකයාගේ වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**රැකියා කොන්දේසි** - පත්වීම කොන්ත්‍රාත් පදනමින් සිදු වේ.

**වෙනත් ප්‍රතිලාභ** - අධිකාරිය විසින් 12%ක් සහ සේවකයා විසින් 8%ක් සේවක අර්ථසාධක අරමුදලට දායක කරන අතර, සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට 3% ක දායකත්වයක් සහ රජයේ අනුමත දීමනාවන් ගෙවනු ලැබේ.

**වැදගත්**

- අයදුම්කරුවන් විසින් අයදුම් කරන තනතුරට අදාල අයදුම්පත්‍රය මාර්ග සංවර්ධන අධිකාරියේ නිල වෙබ් අඩවිය වන **rda.gov.lk** වෙතින් භාගත කරගත යුතුය.

- අයදුම් කරන තනතුරට අදාල අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්වල සහතික කල ඡායා පිටපත් අදාල අයදුම්පත්‍රයට ඇමිණිය යුතුය.

- අයදුම්කරුගේ තොරතුරු දැන ගැනීම සඳහා තොරතුරු විමසිය හැකි ඥාති නොවන දෙදෙනෙකුගේ විස්තරද සඳහන් කර තිබීම අනිවාර්ය වේ.

- අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනයෙන් පසුව ලැබෙන අයදුම්පත්, නිසි ආකෘතියට අනුකූල නොවූ සහ ඉහත නිර්ණායකයන්ට අනුකූලව අවශ්‍ය සුදුසුකම්, පළපුරුද්ද සහ අදාල ලේඛණ ඇතුළත් නොවන අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- විධිමත් පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2021.04.21 දිනට පෙර අධ්‍යක්ෂ (පාලන), මාර්ග සංවර්ධන අධිකාරිය, "මගනැගුම මහ මැදුර", අංක 216, ඩෙන්සිල් කොබ්බෑඩුව මාවත, කොස්වත්ත , බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

- රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, මණ්ඩල සහ අධිකාරිවල සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානින් මගින් ඉදිරිපත් කළ යුතු වේ.


**අධ්‍යක්ෂ ජනරාල්**

**මාර්ග සංවර්ධන අධිකාරිය,**

**මගනැගුම මහ මැදුර, අංක 216, ඩෙන්සිල් කොබ්බෑඩුව මාවත, කොස්වත්ත , බත්තරමුල්ල**

**ඊමේල් - headoffice198621@gmail.com**